**ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය- සංරචක 02 (පළාත් මාර්ග වැඩිදියුණු කිරීම) - 2021**

---

ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය- සංරචක 02 ( පළාත් මාර්ග වැඩිදියුණු කිරීම) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 සැප්තැම්බර් 29 දින එළඹි අංක 5788 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛන 01 හි 4.2 ව්‍යාස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතියේ සංශෝධිත මූල්‍ය ගිවිසුමට අනුව, එවකට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය රාජ්‍ය අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර සියලුම පළාත්වල පළාත් මාර්ග අධිකාරීන් සංශෝධිත සංරචක 02 ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ වත්කම් කළමණාකරණ පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතාව ශක්තිමත් කිරීම හා පළාත් මාර්ග සඳහා ප්‍රවේශ හා කළමණාකරණ රාමුව වැඩිදියුණු කිරීම වේ. ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,875 කට සමාන එජඩො මිලියන 125ක් වේ. ව්‍යාපෘතියේ සංශෝධිත මූල්‍ය ගිවිසුමට අනුව, සංශෝධිත සංරචක 02 හි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 19,075කට සමාන එජඩො මිලියන 109ක් වේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 මැයි 02 දින ආරම්භ කර තිබුණු අතර 2023 මාර්තු 31 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 මතය

---

ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා

ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------------

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2018 අගෝස්තු 15 දිනැති අංක 18/1682/805/051 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | අමාත්‍යාංශයේ සේවයේ නියුතු සුදුසු කාර්යමණ්ඩලයක් අන්තර්ගහනය කරමින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ පළාත් මට්ටමේ ක්‍රියාත්මක කිරීමේ ඒකක පිහිටු විය යුතුය. අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ කිසිවකු ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට පත්කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා සුදුසු අමාත්‍යාංශය කාර්ය මණ්ඩලයක් අන්තර්ගහනය කිරීම අත්‍යවශ්‍ය අවශ්‍යතාවක් නොවේ. | අමාත්‍ය මණ්ඩල තීරණය සමග අනුකූලවීම අවශ්‍ය වේ. |
| (ආ) | මුදල් රෙගුලාසි 756 සහ 757 | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර කරමින් පවතී. | භාණ්ඩ සමීක්ෂණය වාර්ෂික සිදුකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2019 ජනවාරි 12 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | වර්ෂය තුළදී කළමනාකරණ විගණන කමිටු රැස්වීම් 04 ක් පැවැත්වීම අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් වාර 02 ක් පමණක් පවත්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | කළමනාකරණ හා විගණන කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්විය යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| | විගණන ගැටලු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ප්‍රතිසංවිධාන පත්‍රයේ ඇතුළත් කර තිබුණු එකගවූ ප්‍රසම්පාදන සැලැස්ම අනුව 2019 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් පැකේජ 37ක් ප්‍රදානය කළ යුතුව තිබුණි. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට පැකේජ 26ක් පමණක් පිරිනමා තිබුණි. | එ.ජ.ඩො මිලියන 70ක කටයුතු නිමකර ඇත. | ව්‍යාපෘතිය නිමකිරීම සඳහා කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2019 වර්ෂයේදී පිරිනමන ලද අදියර 1හි එස්පී 01, එස්පී 02, එස්ඩබ්ලිව්පී 01, ඊපී 01 සහ ඊපී 02 පැකේජ නියමිත දිනයන්වල නිමකර නොතිබුණි. | පිළිගනී. | -එම- |

**3.2 මතභේදාත්මක ස්වභාවයේ ගැටලු**

| | විගණන ගැටලු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2018 අගෝස්තු 15 දිනැති අංක අමප/18/1682/805/051 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ව්‍යාපෘතියේ පිරිවැය අඩුකර ගැනීමේ අරමුණින් දැනට සිටින කාර්ය මණ්ඩලය යොදා ගනිමින් සියලුම පළාත්වල ව්‍යාපෘති කළමනාකරණ ඒකක ස්ථාපනය කළ යුතුය. කෙසේවෙතත්, පළාත් මට්ටමේ විධායක ඉංජිනේරුවරුන් ව්‍යාපෘතියේ සහකාර නේවාසික ඉංජිනේරුවරුන් ලෙස පත්කර ඇති අතර වැඩ ප්‍රමාණ පත්‍රයෙහි නඩත්තු පිරිවැය රු.මිලියන 170ක් ඇස්තමේන්තු කර තිබුණු අතර 2022 මාර්තු 31 දිනට රු.මිලියන 119ක් ගෙවා තිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය සඳහා විධායක ඉංජිනේරු කාර්යාලයේ වාහන භාවිත කළ හැකි වුවද, කොන්ත්‍රාත් ගෙවීම් බිල්පත්වලට විචලාතා ඇතුළත් කරමින් 2022 මාර්තු 31 වන තෙක් මෙම සහකාර නේවාසික ඉංජිනේරුවරුන් සඳහා වාහන සැපයීම වෙනුවෙන් එකතුව රු.මිලියන 65ක් ගෙවා තිබුණි. | මෙවැනි විශාල කොන්ත්‍රාත් සහිත ලෝක බැංකු ව්‍යාපෘතිවල වැඩබිම් ආසන්නයේ සහකාර නේවාසික ඉංජිනේරුවරුන්ගේ කාර්යාල පවත්වා ගත යුතු අතර ගෙවීම භාණ්ඩාගාරය අනුමත කර තිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අනුගත විය යුතුය. |
| (ආ) | ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද 2019 දෙසැම්බර් 19 දිනැති අංක පීඑස්/එස්පී/එස්බී/චක්‍රලේඛ/06/2019 දරන චක්‍රලේඛයට අනුව ව්‍යාපෘතියේ කොටසක් වශයෙන් ව්‍යාපෘති කළමනාකරණයේදී අධික ගණුදෙණු පිරිවැයක් ලෙස විශාල මුදලක් දැරීමට සිදුවන බව දක්වා ඇති අතර එය විචක්ෂණ රාජ්‍ය | යොමුගත චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර ව්‍යාපෘතිය සැලසුම්කර තිබූ අතර උපදේශකවරුන් සේවයේ යොදවා තිබුණි. | අදාළ චක්‍රලේඛය සමග අනුකූලවීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | මූල්‍ය කළමනාකරණය සහ වගවීම සඳහා අහිතකර ලෙස බලපා ඇති බව දක්වා තිබුණද චක්‍රලේඛයට අවධානය යොමු කිරීමකින් තොරව පවතින සම්පත් භාවිතය වෙනුවට එකතුව රු.මිලියන 145ක් ගෙවා තිබුණි. | | |
| (ඇ) | ව්‍යාපෘතිය සඳහා උපදේශකවරුන් තෝරා ගැනීමේදී තෝරාගත් අයදුම්කරුගේ ලංසුවේ ප්‍රවාහන පහසුකම්, වාහන වෙන් කිරීම් සඳහන් කර නොතිබුණු අතර එම තොරතුරු ප්‍රසම්පාදන දැන්වීමේ සඳහන් කර නොතිබුණි. කෙසේවෙතත්, වාහන සපයන බව කොන්දේසියක් ඇතුළත් කර නේවාසික ඉංජිනේරුවන් සමග ගිවිසුම් අත්සන් කර තිබුණි. එමනිසා 2022 මාර්තු 31 තෙක් නේවාසික ඉංජිනේරුවන් සඳහා වාහන, නිවාස සහ ලිබඩු සැපයීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු.මිලියන 73ක අඛණ්ඩ ගෙවීමක් සිදුකර තිබුණි. | ව්‍යාපෘතිය හා සම්බන්ධ වසර 20කට වඩා පළපුරුද්දක් සහිත පුද්ගලයින් ක්‍රියාවලිය අනුගමනය කළයුතු බව දන්නා කරුණකි. එමනිසා, එය ලංසු ලියවිලිවල සහ ප්‍රසම්පාදන දැන්වීමේ සඳහන් කර නොතිබුණි. | ව්‍යාපෘතිය අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දීමට පියවර ගත යුතුය |
| (ඇ) | කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුව කොන්ත්‍රාත්තුව අවසානයේ නේවාසික ඉංජිනේරු කාර්යාලයට අයත් ලිබඩු සහ උපකරණ පමණක් රේඛීය අමාත්‍යාංශයට භාරදිය යුතුය. කෙසේවෙතත්, සහකාර නේවාසික ඉංජිනේරු කාර්යාලයට, නේවාසික ඉංජිනේරු සහ සහකාර නේවාසික ඉංජිනේරු නිවාස වෙත සපයන ලද සියලුම ලිබඩු සහ උපකරණ කොන්ත්‍රාත්කරුගේ දේපල වේ. ඒ අනුව කොන්ත්‍රාත් ගිවිසුමේ පවතින වරදක් හේතුවෙන් රජයේ මුදල් මගින් ගෙවන ලද රු.මිලියන 42ක වත්කම්වල අයිතිය රජයට අහිමිවනු ඇත. එමනිසා වියදම රජයට පාඩුවක් බවට පත්වේ. | නේවාසික ඉංජිනේරු කාර්යාලයේ ලිබඩු අමාත්‍යාංශයේ දේපළක් වුවද, සහකාර නේවාසික ඉංජිනේරු කාර්යාලයේ ලිබඩු කොන්ත්‍රාත්කරුගේ දේපල වේ. එය අත්වැරදීමක් නොවේ. නමුත් කොන්ත්‍රාත් ලියවිලි සකස් කිරීමේදී ඒ පිළිබඳ තීරණයක් ගෙන තිබුණි. | එවැනි වියදම් වළක්වා ගැනීමේ අරමුණින් කොන්ත්‍රාත් ගිවිසුම් සකස් කළ යුතුය. |

**3.3 වැඩබිම් පරීක්ෂාවේදී කරණ ලද නිරීක්ෂණ**

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| **වයඹ පළාත- එන්ඩබ්ලිව්පී පැකේජ 1,2,3**<br>මෙම පැකේජයේ මාර්ග 12ක් අතරින් මාර්ග 4ක් සංවර්ධනය ශක්‍යතා අධ්‍යන සහිතව නිසි ක්‍රමවේදයක් භාවිත නොකර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් තෝරාගෙන තිබුණු අතර අනෙකුත් මාර්ග 08 දේශපාලන අධිකාරිය විසින් කරන ලද ඉල්ලීම් පරිදි තෝරාගෙන තිබුණි. කෙසේවෙතත්, 2015 සිට 2020 දක්වා පසුගිය වර්ෂ 05 තුළදී එම තෝරාගත් මාර්ග නඩත්තු කිරීම සඳහා එකතුව රු.මිලියන 33.1ක් වැයකර තිබුණි. | 2015 සිට 2020 දක්වා නඩත්තු වියදම් 2022 මාර්තු 29 දිනැති අංක මාසං/1/3/17/22 දරන පළාත් අධ්‍යක්ෂකගේ ලිපිය මගින් විගණනය වෙත යවා තිබුණි. | සංවර්ධනය සඳහා මාර්ග තෝරා ගැනීමට පිළිගත හැකි ක්‍රමවේදයක් භාවිත කළ යුතුය. |